ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013.03.19 |

**ශ්‍රී ලංකා මහ බැංකුව "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" නමින් නව ග්‍රන්ථයක් නිකුත් කරයි.**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති සහ මුදල් මණ්ඩලයේ ලේකම් පී. සමරසිරි මහතා විසින් රචිත තෙවන ග්‍රන්ථය වන "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" යන ග්‍රන්ථය අද නිකුත් කෙරින. මෙම ග්‍රන්ථය තුලින් ආර්ථිකයක ක්ෂුද්‍ර, සාර්ව, මූල්‍ය, රාජ්‍ය සහ විදේශීය යන සෑම අංශයකම ක්‍රියාකාරිත්වයට අදාල ප්‍රධාන මූලධර්ම සහ ප්‍රායෝගික කරුණු මෙන්ම විශ්ලේෂණ ක්‍රමයන්ද ඉතාමත් සරල බස් වහරක් යොදාගෙන පියවරින් පියවර ඉදිරිපත් කොට ඇති බැවින් මෙම ග්‍රන්ථය පරිශීලණය ඉතාමත් පහසුය. එබැවින්, මෙය අ.පො.ස. උසස් පෙළ, විශ්ව විද්‍යාල සහ වෘත්තීමය පාඨමාලාවන්හි ආර්ථික විද්‍යාව සහ මූල්‍ය විෂයන් හදාරණ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට ඉතා ප්‍රයෝජනවත් ආර්ථික විද්‍යා ග්‍රන්ථයකි. ඔහුගේ පළමු ග්‍රන්ථය වූ "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය" 2010 අගෝස්තු මස ද, දෙවන ග්‍රන්ථය වූ "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" 2011 නොවැම්බර් මස ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම පොත් දෙකෙහි ද්විඩ භාෂා පරිවර්ථනයන්ද ප්‍රකාශයට පත්කොට ඇත.**

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික සහ මූල්‍ය පිළිබඳව දැනුම මහජනයා අතර බෙදා හැරීම පිණිස විවිධ ප්‍රකාශනයන් සහ වැඩ සටහන් යොදා ගන්නා අතර ඒ සඳහා තවත් පියවරක් වශයෙන් සමරසිරි මහතාගේ මෙම තෙවැනි ආර්ථික විද්‍යා ග්‍රන්ථය ප්‍රකාශයට පත් කෙරින. මෙම ග්‍රන්ථය විශාල පිරිසකගේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික ආර්ථික විද්‍යා සහ මූල්‍ය දැනුම ප්‍රගුණ කිරීමට උර දෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික අධ්‍යාපන සේවයකි.**

**මෙම පොත් රාජගිරියෙහි පිහිටි මහ බැංකු විදු පියසෙහි අලෙවි කවුළුවෙන්ද, ප්‍රාදේශීය කාර්යාලවලින්ද මිලදී ගත හැකිය.**

